කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය
பெண்கள் மற்றும் ஊடகக் கூட்டமைப்பு
Women and Media Collective
Established 1984

# කාන්තාව සහ මාධ්‍ය සාමූහිකය විසින් කාන්තා අයිතිවාසිකම් සහ ස්ත්‍රී පුරුෂ සමජභාවී සමානාත්මතාවට අදාළ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ සඳහා වන යෝජනා ඉදිරිපත් කිරීම

## නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කිරීම සඳහා වන විශේෂඥ කමිටුව වෙත

**2020 දෙසැම්බර්**

දෙවන ජනරජ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ශ්‍රී ලංකාවාසී ස්වෛරී ජනතාව විසින් 1978 දී සම්මත කරන ලද අතර මේ දක්වා එහි සංශෝධන 20 ක් සාර්ථක ලෙස සිදුව ඇත. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් යනු, ජනතාවගේ අත්හළ නොහැකි පරමාධිපත්‍යය ශ්‍රී ලංකාවාසී ජනතාවගේ; ස්වෛරීභාවයේ දිගුවක් වන - නීතියේ ආධිපත්‍යය, බලතල බෙදීම, පරමාධිපත්‍යය, මූලික අයිතිවාසිකම්, ඡන්ද බලය සහ ඡන්ද විමසීම් සහ ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳ මූලධර්ම ඇතුළත පාලනයේ ශාඛාවන් බවට පරිවර්තනය කරන්නා වූ මූලික පදනමයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවන් ප්‍රබල වන අතර ශ්‍රී ලංකාව වැනි බහුත්ත්ව සමාජයක ජනතාවගේ විවිධාකාර අභිලාෂයන් පිළිබිඹු කිරීම සඳහා ව්‍යවස්ථාව සීමාව ඉක්මවායන බවට නවීන ව්‍යවස්ථානුකූල චින්තනය විසින් අපේක්ෂා කරයි. නවීන ව්‍යවස්ථාවක්, දීර්ඝ කාලයක් පුරාවට සුරක්ෂිතව පැවත එන න්‍යායන් සහ මූලධර්ම පිළිබිඹු කරන වටිනාකම අඩු නොවන ස්වභාවයක පොදු මූලධර්ම ලෙස ස්ථාපිත වී ඇති ජාත්‍යන්තර අස්ථීත්‍යක් ලෙසට ශ්‍රී ලංකාව පිළිබඳ පිළිබිඹු කරන ආකාරයේ ව්‍යවස්ථාවක් වීමට ද අපේක්ෂා කළ යුතුය. එබැවින්, යෝජිත නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව, ජනතාව වෙනුවෙන්, ජනතාව විසින් සහ ජනතාව සම්බන්ධයෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් ලැබීමට සුදුසු, ශ්‍රී ලංකාවාසී ජනතාව විසින් ඉතා දැඩි උනන්දුවකින් බලා සිටින, රජයේ සහ පුරවැසි සමූහයේ ක්‍රියාකාරී ස්වභාවයට වඩාත් ගැලපෙන සහ ඉහත සියල්ල පිළිබඳ පිළිබිඹු කරන පරිදි විය යුතු බවට තීරණාත්මක වේ.

පහත දැක්වෙන ඉදිරිපත් කිරීම පහත මූලාශ්‍රයන්ගෙන් උකහාගත් ඒකාබද්ධ ලේඛනයකි:

- කාන්තා අයිතිවාසිකම්, ස්ත්‍රී පුරුෂ සමජභාවී සමානාත්මතාව සහ මැතිවරණ ප්‍රතිසංස්කරණ වලට අදාළ යෝජිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා විධිවිධාන පිළිබඳ කාන්තා කණ්ඩායම් සහ ජාල විසින් මැතිවරණ ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන නියෝජන කමිටුව වෙත කරන ඒකාබද්ධ ඉදිරිපත් කිරීම් - 2016, මාර්තු 10

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණය තුළ ස්ත්‍රී පුරුෂ සමජභාවී දෘෂ්ටිකෝණය පිළිබඳ ක්‍රියාකාරී කමිටුව විසින් ඉදිරිපත් කරන ලද ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කාන්තා අයිතිවාසිකම් තර කිරීම පිළිබඳ වාර්තාව - 2016 අගෝස්තු 22

- මැතිවරණ ප්‍රතිසංස්කරණ පිළිබඳ මහජන නියෝජන කමිටුව විසින් ඉදිරිපත් කරන ලද මැතිවරණ ප්‍රතිසංස්කරණයේ මහජන නියෝජන පිළිබඳ වාර්තාව - 2016 මැයි

56/1, සරසවි මාවත, කාසල් වීදිය, කොළඹ 8, ශ්‍රී ලංකාව
சரசவி லேன், காசல் வீதி, கொழும்பு 8, இலங்கை.
Sarasavi Lane, Castle Street, Colombo 8, Sri Lanka

Telephone: +94-11-2690192, 5632045, 5635900, 5635800, 2690201, Fax: +94-11-2690192, 2690201, Email: wmcsrilanka@gmail.com
www.womenandmedia.org facebook.com/womenandmediacollective twitter.com/womenandmedia

Registration No. GA 2476

පහත දැක්වෙන ඉදිරිපත් කිරීම මගින් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ කාන්තාවන්ගේ දේශපාලනික, සිවිල් සහ සමාජ අයිතිවාසිකම් පිළිබඳ අවධාරණය කරනු ලබන අතරම, එයින් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට එකතු කරනු ලැබිය යුතු ප්‍රධාන ප්‍රමුඛතාවන් ද යෝජනා කරයි.

## ආ) මූලික අයිතිවාසිකම්

මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදය යටතේ අප විසින් පහත දැක්වෙන කරුණු පැහැදිලි ලෙසම යෝජනා කරන්නෙමු.

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගත කොට ඇති දැනට පවතින අයිතිවාසිකම් පුළුල් කිරීම
2. මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයට නව අයිතිවාසිකම් එකතු කිරීම
3. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන කාලයේදී බලාත්මක වන දැනට පවතින නීති, චාරිත්‍ර වාරිත්‍ර, සම්ප්‍රදායයන් පිළිබඳ සමාලෝචනයසඳහා විධිවිධාන සැලැස්වීම

1. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගත කොට ඇති දැනට පවතින අයිතිවාසිකම් පුළුල් කිරීම

- වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 12(2) වන ව්‍යවස්ථාවේ වෙනස්කොට නොසැලකීම පිළිබඳ වගන්තියට පහත දැක්වෙන අතිරේක හේතූන් ඇතුලත් විය යුතුය.

  කිසිම තැනැත්තකු ජන වර්ගය, ආගම, කුලය, විවාහක තත්ත්වය, මාතෘත්වය, වයස, භාෂාව, මානසික හෝ ශාරීරික අශක්නුතා, ගර්භණීභාවය, සිවිල් තත්ත්වය, වන්දඹුභාවය, ලිංගික දිශානතිය හෝ ස්ත්‍රී පුරුෂභාවය සහ ස්ත්‍රී පුරුෂ සමජභාවී අනන්‍යතාවන් යන හේතු මත වෙනස්කමකට හෝ විශේෂයකට හෝ භාජන නොවිය යුත්තේ ය.

- සියලු තැනැත්තන් නීතිය ඉදිරියේදී සමාන බවත් නීතියේ ආරක්ෂාව සහ නීතියේ ප්‍රතිලාභ ලැබීමට සියලු තැනැත්තන් එක සේ හිමිකම් ලබන බවත් අප විසින් යෝජනා කරන්නෙමු.

- සුරැකුම් ආර්ථිකයෙහි නිරත කාන්තාවන්ගේ කාර්යය, දැනට 14(1)උ වන ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති පරිදි රැකියාවක නිරත වීමේ නිදහසට සංයුක්ත වන පරිදි ඵලදායී කාර්යයක් ලෙස පිළිගනු ලැබිය යුතු බව අප විසින් යෝජනා කරන්නෙමු.

2. මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයට නව අයිතිවාසිකම් එකතු කිරීම

- සෑම තැනැත්තකු සඳහාම ජීවත් වීමේ සහ අභිමානය සඳහා ඇති අයිතිවාසිකම ප්‍රකාශිතවම ක්‍රියාත්මක කරනු ලැබිය යුතු බව අපි යෝජනා කරන්නෙමු.
- කාන්තාවන් ඇතුළුව සියලු තැනැත්තන්ට සියලු ආකාරවල හිංසන සහ පීඩාවන් වලින් නිදහස් වීමේ සහ පුද්ගලික මෙන්ම ප්‍රසිද්ධ ස්ථානවලදී වධහිංසා වලින් සහ

අවමන් කිරීම්වලින් මෙන්ම කෲර සහ අමානුෂික සැලකිල්ලට ලක්වීමෙන් නිදහස් වීමේ අයිතිවාසිකම තිබිය යුතුය.

- යුක්තිය සඳහා ඉඩ ප්‍රස්ථාව ලබා ගැනීම මූලික අයිතිවාසිකමක් ලෙස ඇතුලත් විය යුතුය. සියලු තැනැත්තන්ට සාධනීය ලෙස යුක්තිය සඳහා ඉඩ ප්‍රස්ථාව ලබා දීම රජය විසින් සහතික කළ යුතු අතර, යම් ගාස්තුවක් නියම කරන්නේ නම්, එය සාධාරණ විය යුතු අතර එය යුක්තිය සඳහා ඉඩ ප්‍රස්ථාව ලබා ගැනීමට බාධාවක් නොවිය යුතුය.
- අධ්‍යාපනය, සෞඛ්‍යය, ආහාර, නිවාස සහ සනීපාරක්ෂාව සියලු පුරවැසියන් සඳහා මූලික අයිතිවාසිකම් ලෙසට ඇතුලත් වන ආර්ථික, සමාජ සහ සංස්කෘතික අයිතිවාසිකම් පිළිබඳ ජාත්‍යන්තර සම්මුතියේ අන්තර්ගත අයිතිවාසිකම් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් සම්මත කරගත යුතු බව අප යෝජනා කරන්නෙමු.
- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පිළිගනු ලබන ආර්ථික, සමාජ සහ සංස්කෘතික අයිතිවාසිකම් පූර්ණ ලෙස සපුරා ලීමට පියවර ගැනීම සඳහා රජය විසින් එහි පවත්නා සම්පත්වලින් උපරිම ප්‍රයෝජන ගැනීමට කටයුතු කරනු ඇත.
- ජන වර්ගය, ජාතිකත්වය හෝ ආගම, ස්ත්‍රී පුරුෂ අනන්‍යතාවය හෝ ස්ත්‍රී පුරුෂ සමාජභාවය සහ ලිංගික දිශානතිය හේතුවෙන් සිදු කරනු ලබන යම් සීමාකිරීම් වලින් තොරව වයස සම්පූර්ණ වී ඇති සියලු තැනැත්තන්ට විවාහ වීමේ සහ පවුලක් ගොඩනැගීමේ අයිතිවාසිකම තිබිය යුතුය. ඔවුන් විවාහ වීමට, විවාහයේ පැවතීමට මෙන්ම එය අවලංගු කිරීමට සමාන අයිතිවාසිකම් වලට හිමිකම් ලැබිය යුතුය.
- විවාහය පුද්ගලයින් දෙදෙනාගේ අන්‍යෝන්‍ය කැමැත්ත මත පමණක් සිදු විය යුතු අතර කිසිදු තැනැත්තකු අවුරුදු 18ට අඩු වයසකින් විවාහ කළ නොහැකි විය යුතුය.
- සේවා නියුක්තිය සම්බන්ධ සහ පාරිශ්‍රමිකය සම්බන්ධ කාරණාවලදී ජන වර්ගය, ආගම, කුලය, ස්ත්‍රී පුරුෂභාවය, ස්ත්‍රී පුරුෂ සමාජභාවය, විවාහක තත්ත්වය, මාතෘත්වය, වයස, භාෂාව, මානසික හෝ ශාරීරික අශක්නුතාවක්, ගර්භනීභාවය, සිවිල් තත්ත්වය, ලිංගික දිශානතිය යන හේතු මත වෙනස්කමකට ලක් කිරීම තහනම් කිරීම සඳහා වන අයිතිවාසිකම් පිළිගනු ලැබිය යුතුය.

3. නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ක්‍රියාත්මක වන කාලයේදී බලාත්මක වන දැනට පවතින නීති, චාරිත්‍ර වාරිත්‍ර, සම්ප්‍රදායයන් පිළිබඳ සමාලෝචනය කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස

- වර්තමාන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 16 වන ව්‍යවස්ථාව මගින්, පවත්නා ලිඛිත නීති සහ ලිඛිත නොවූ නීති අතුරෙන් යම් කිසි ලිඛිත නීතියක් හෝ ලිඛිත නොවූ නීතියක් මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයට අනුකූල නොවූව ද එකී සියලු පවත්නා ලිඛිත නීති සහ ලිඛිත නොවූ නීති බලාත්මකව ක්‍රියාත්මක වන බවට විධිවිධාන සලස්වනු ලැබේ. මෙම විධිවිධානය නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නැවත ඇතුලත් නොවිය යුතු බවට අප යෝජනා කරන්නෙමු.
- ලිඛිත මෙන්ම ලිඛිත නොවූ සියලු නීති, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ අන්තර්ගත කොට ඇති අයිතිවාසිකම් වලට අනුකූල වන බව සහතික කර ගැනීම සඳහා මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදය විසින් රජය මත බැඳීමක් ඇති කළ යුතුය.

- අධිකරණ සමාලෝචනය සඳහා හැකියාව අධිකරණයට ලබා දීම මගින් සියලු නීති සම්පාදන, අතීත, වර්තමාන සහ පශ්චාත් නීති පැනවීම් සමාලෝචනය කිරීම සහ ඉවත් කිරීම සඳහා වන යාන්ත්‍රණයක් සඳහා විධිවිධාන සැලැස්වීම තුලින් මෙය ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය.

## ඈ) රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම

- රාජ්‍ය ප්‍රතිපත්තිය මෙහෙයවීමේ මූලධර්ම පිළිබඳ දීර්ඝ විස්තර සහිත ලැයිස්තුවක් PRC වාර්තාවේ ඇතුලත් වේ. මෙම මූලධර්මවල හරය පිළිගනු ලබන අතරම, මෙහෙයවීමේ මූලධර්ම රාජ්‍ය පාලනයකට වඩා ඒවායෙහි දැඩි නිශ්චිත ස්වභාවය අවධාරණය කිරීම උදෙසා අප විසින් ඒවා **'රජයේ බැඳීම්'** ලෙස සකස් කිරීම නිර්දේශ කරන්නෙමු. එවැනි වෙනස් කිරීමක් රාජ්‍ය බැඳීම් මත බලපෑමක් ඇති කරන්නා වූ ජාත්‍යන්තර සංවර්ධනයන් සහ නීතිය සමග අනුකූල වන්නේ ය.

- "රජයේ බැඳීම්" යන පදයෙන්, නීතියෙන් කටයුතු කළ හැකි නොවන, විධානයක් වැනි සැලකීමකට පටහැනිව රජයට එහි අදාළ බැඳීම සමග අනුකූල වීමට ඇති බැඳීම පිළිබඳ තදින් අවධාරණය කෙරේ.

- රාජ්‍ය බැඳීම්, රජයට එරෙහිව නිසි උද්යෝගී ප්‍රමිතියකට විනිශ්චය කරනු ලබන පරිදි නීතියෙන් කටයුතු කළ හැකි සේ විය යුතු බව අප යෝජනා කරන්නෙමු. රාජ්‍ය බැඳීම් සහ මූලික අයිතිවාසිකම් අතර වෙනස වන්නේ රාජ්‍ය බැඳීම් යටතේ අධිකරණයක අධිකරණ බලය අයැද සිටින යම් තැනැත්තකුට එකී බැඳීම සම්බන්ධයෙන් යම් පුද්ගලික අයිතිවාසිකමක් හෝ ප්‍රතිකර්මයක් ලබා ගැනීමේ හැකියාවක් නොමැති වීමයි. එවැනි තැනැත්තකුට අවසර ලැබෙන්නේ සාමාන්‍ය පරිදි රාජ්‍ය බැඳීම සමග අනුකූල වීමට රජයට යම් විධානයක් හෝ උචිත නියමයක් ලබා දීමට ඉල්ලා සිටීම පමණකි.

- රජයේ බැඳීම් ලෙස නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැහැදිලිව දැක්විය යුතු තත්ත්වාකාර බැඳීම් පරාසයක් පිළිගෙන ඇත්තේ යම් ඓතිහාසික කැපවීමක් යටතේ ද, රාජ්‍ය බැඳීම්, ශ්‍රී ලංකා රාජ්‍යයේ සුභ සාධනය උදෙසා එම ඓතිහාසික කැපවීම වෙනුවෙන් වගකීමට බැඳිය යුතු ය.

- රාජ්‍ය බැඳීම මගින් රාජ්‍යයේ ජනතාව සහ ප්‍රජාවන් අතර ප්‍රතිසන්ධනය වැඩි දියුණු කිරීම සඳහා වන රාජ්‍යයේ බැඳීම ද පිළිගත යුතු ය.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ වන බලතල යටතේ විධායකය විසින් සිදු කරනු ලබන පත් කිරීම් වලදී කාන්තා නියෝජනය තහවුරු කිරීමේ බැඳීම සැලකිල්ලට ගත යුතු බව රාජ්‍යය විසින් සහතික කළ යුතු ය.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ රාජ්‍යය විසින් සහතික කර ඇති අයිතිවාසිකම් උල්ලංඝනය කරන යම් පුද්ගලයෙකුට, ආයතනයකට සහ රාජ්‍ය නොවන ක්‍රියාකරුවකුට එරෙහිව ක්‍රියාමාර්ග ගැනීමට රාජ්‍යයට බැඳීමක් තිබිය යුතු ය.

## ඉ) විධායකය

- 20 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ප්‍රකාරව පාර්ලිමේන්තු සභාව ඉවත් කොට කාන්තාවන්ගේ නියෝජනයකින් සහ පොදු මහජනතාව අතරින් තැනැත්තන් දෙදෙනෙකුගෙන් සමන්විතව 19 වන ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනය ප්‍රකාරව ව්‍යවස්ථාදායක සභාවක් ප්‍රතිස්ථාපනය කරන ලෙසට අප තවදුරටත් යෝජනා කරන්නෙමු.
- නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින්, එක්සත් ජනපදයේ මන්ත්‍රී මණ්ඩල නඩු විභාගවල මෙන් සියලු නඩු විභාග ප්‍රසිද්ධියේ සිදු කරමින් නියෝජනයේ නිසි අයිතීන් සහිතව කාර්ය පටිපාටි සහ විනිවිදභාවයකින් යුත් නඩු විභාග කිරීම් ද ස්ථාපනය කළ යුතු ය.
- මානව හිමිකම් කොමිෂන් සභාවට ව්‍යවස්ථාමය භාවයක් ලබා දිය යුතු බව අප යෝජනා කරන්නෙමු.
- අමාත්‍ය මණ්ඩලය අවම වශයෙන් ඉන් 1/3ක කාන්තා නියෝජනයකින් සමන්විත විය යුතු බව අප යෝජනා කරන්නෙමු.
- විෂයයන් සහ කර්තව්‍යයන් නිශ්චය කිරීමේදී, ආරක්ෂක, මුදල්, පරිසර, කෘෂිකර්ම, විදුලිබල හා බලශක්ති, අධ්‍යාපන, සෞඛ්‍ය, සංචාරක සහ කාන්තා කටයුතු ඇතුළු ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාරව පත් කරනු ලැබිය යුතු නිශ්චිත අනිවාර්ය අමාත්‍යංශ තිබිය යුතු බව අප යෝජනා කරන්නෙමු.
- පාර්ලිමේන්තුව විසින් නීතියක් මගින් කාන්තාවන් සඳහා කොමිෂන් සභාවක් පිහිටුවීමට විධිවිධාන සැලැස්විය යුතු ය.
  එවැනි නීතියක් මගින් පහත දේ සඳහා විධිවිධාන සැලැස්විය යුතු ය;
  a) ව්‍යවස්ථාදායක සභාවේ නිර්දේශය මත ජනාධිපතිවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයින් පත් කිරීම.
  b) රජය වෙත නිර්දේශයන් සිදු කිරීම, රාජ්‍ය අස්ථිත්‍යන් වෙත විධානයන් ලබා දීම මෙන්ම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව යටතේ හෝ ඉහත කී කාන්තාවන් සඳහා වන නීතිය මගින් සහතික කරන ලද අයිතිවාසිකම් උල්ලංඝනය කරමින් කටයුතු කරන්නා වූ යම් රාජ්‍ය නොවන ක්‍රියාකරුවකු වෙත මාර්ගෝපදේශ සහ නිර්දේශ නිකුත් කිරීම සඳහා ඇති බලතල ඇතුළු කොමිෂන් සභාවේ බලතල.
  c) කාන්තාවන්ට එරෙහි සියලු ආකාරයේ වෙනස්කම්වලට එරෙහි ප්‍රඥප්තිය (CEDAW) සහ ශ්‍රී ලංකාව එක් පාර්ශවයක් වන කාන්තාවන්ගේ අයිතිවාසිකම් වලට අදාළ වෙනත් යම් ජාත්‍යන්තර ප්‍රඥප්තියක් ක්‍රියාවට නැංවීම සඳහා ගත යුතු පියවර.

- 41(ආ) වන ව්‍යවස්ථාවේ උපලේඛනයේ දක්වා ඇති විවිධ කොමිෂන් සභාවල සියලු පත් කිරීම් 1/3 ක කාන්තා නියෝජිතයින්ගෙන් යුත් අනිවාර්ය කෝටාවකින් සමන්විත විය යුතු බව අප යෝජනා කරන්නෙමු.

## ඊ) ව්‍යවස්ථාදායකය

ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කරන ලද අනුකූල නොවීම පිළිබඳ ප්‍රකාශයන් ක්‍රියාත්මක කිරීම සඳහා උචිත නීති ක්‍රියාවට නැංවීමට ව්‍යවස්ථාදායකය බැඳී සිටීම අවශ්‍ය වේ. මෙමගින්, පවත්නා යම් නිශ්චිත නීතියක්, භාවිතයක්, චාරිත්‍රයක් හෝ සම්ප්‍රදායක් මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදය උල්ලංඝනය කරන බවට හඳුනාගනු ලබන අවස්ථාවක දී, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් කරන ලද අනුකූල නොවීම පිළිබඳ නිර්ණයන් ක්‍රියාත්මක කරනු ඇත.

## උ) ජනමත විචාරණ ඇතුළුව ඡන්ද බලය, ඡන්ද විමසීම් හා මැතිවරණ

- මැතිවරණ ප්‍රතිසංස්කරණ සඳහා වන යෝජනා සැලකිල්ලට ගනිමින්, පහත දැක්වෙන දෑ ක්‍රියාත්මක කිරීමට නීති පිළියෙළ කිරීම සඳහා වන නියමය ඇතුළුව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 101 වන ව්‍යවස්ථාවේ මෙන් ඒ හා සමාන විධිවිධානයක් නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් සැලැස්වීමට අප යෝජනා කරන්නෙමු.

- ශ්‍රී ලංකාවේ මැතිවරණ ක්‍රමය, ආසන ගණනින් 50%ක් සමානුපාතික නියෝජන ක්‍රමයක් මගින් තෝරා පත් කරගනු ලබන අතර අනෙක් 50% බහුතරවාදී first past the post ක්‍රමයෙන් (කේවල ක්‍රමය) තෝරා පත් කරගනු ලබන පරිදි වන මිශ්‍ර- මන්ත්‍රී සමානුපාත ක්‍රමයක් විය යුතු ය.

- බහුතරවාදී ක්‍රමය යටතේ FPP ක්‍රමයේ (කේවල ක්‍රමයේ) ආසන සඳහා තරඟ වැදීමට එක් පක්ෂයකින් නාම යෝජනා කරනු ලබන අපේක්ෂකයින් සංඛ්‍යාවෙන් අඩක් වත් කාන්තාවන් විය යුතුය. කාන්තාවන්ට ලියාපදිංචි දේශපාලන පක්ෂයකින් නියෝජනය ලබාගත හැකි බව සහතික කිරීම සහ නාමයෝජනා ලැයිස්තුවට ඇතුලත් වීම සඳහා නීති ප්‍රකාශනය කිරීම සඳහා ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් විධිවිධාන සැලැස්විය යුතු ය.

- යම් තෝරා පත් කර ගත් මණ්ඩලයක් සඳහා වන මැතිවරණ ක්‍රියාවලිය සඳහා විධිවිධාන සලස්වන යම් නීතියක, ස්ත්‍රී සහ පුරුෂ යන දෙපාර්ශවයේම සහභාගිත්වය ඇති විට එම පාර්ශවයන් දෙක අතර එක් එක් පාර්ශවය සඳහා සමානුපාතික නියෝජන ක්‍රමයේ සහ ජාතික ලැයිස්තුවේ මුළු අපේක්ෂක සංඛ්‍යාවෙන් සියයට හතළිහකට (40%) අඩු නොවන සහ සියයට හැටකට (60%) වැඩි නොවන පරිදි යුක්ති සහගත සමබරතාවයක් තිබිය යුතු බවට ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් නියෝග කළ යුතු ය.

- සමානුපාතික නියෝජන ක්‍රමය සහ ජාතික ලැයිස්තුව, ප්‍රමුඛතා අනුපිළිවෙලට ස්ත්‍රී සහ පුරුෂ අපේක්ෂකයින් අතර ප්‍රත්‍යාවර්ත වන සංවෘත ඇවුරුණු ලැයිස්තුවක් විය යුතු ය. මෙම නියමයෙන්, දේශපාලන පක්ෂයන්, ස්ත්‍රී අපේක්ෂකයින් වැඩි

ප්‍රතිශතයක් ලැයිස්තුවේ පහතට හෙළීම වැනි ප්‍රජාතන්ත්‍රවාදී නොවන ක්‍රියාවන්හි නිරත වීමෙන් වලක්වන අතර එමගින් ඔවුන්ගෙන් වැඩි ප්‍රමාණයක් ජයග්‍රහණය කළ නොහැකි තත්ත්ව වල සිටීමෙන් වලක්වනු ලැබේ.

- සමානුපාතික සහ/හෝ ජාතික ලැයිස්තුව මැතිවරණ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීමෙන් අනතුරුව කිසිදු එකතු කිරීමක් හෝ වෙනස් කිරීමක් සිදු කළ නොහැකි විය යුතු ය.

- ස්වභාවයෙන් බහුවිද වන මැතිවරණ කොට්ඨාශ සඳහා (පාර්ලිමේන්තු සහ පළාත් සභා මැතිවරණ සඳහා) බහු මන්ත්‍රී ආසන නිර්දේශ කරනු ලැබේ.

- දැනට 104(ආ) වන ව්‍යවස්ථාවේ විධිවිධාන සලස්වා ඇති පරිදි මැතිවරණ කොමිෂන් සභාවේ කාර්යයන් සහ කර්තව්‍යයන් වලට, යම් ලියාපදිංචි දේශපාලන පක්ෂ වල නාමිකයන්ගේ ලැයිස්තුවේ අවම ප්‍රමාණය සහතික කිරීම සඳහා වන කාර්යයක් ඇතුලත් විය යුතු ය.

- කාන්තාවන්ට නාමිකයකු වීමට හැකිවන තත්ත්වයක් නිර්මාණය කිරීමේ දේශපාලන පක්ෂවල සහ මැතිවරණ කොමිෂන් සභාවේ කාර්යය සඳහා නීතිය මගින් විධිවිධාන සලස්වනු ලැබීමට නියම කරනු ලැබිය යුතුය. ලියාපදිංචි වීමට හෝ ලියාපදිංචිය අලුත් කිරීමට අපේක්ෂා කරන දේශපනල පක්ෂ වලට, ඔවුන්ගේ සියලු පක්ෂ තීරණ ගැනීමේ මණ්ඩල වලට අවම වශයෙන් 30%ක ප්‍රමාණයක් කාන්තාවන් තෝරා පත්කර ගෙන තිබිය යුතු බවට නීතිය මගින් නියම කරනු ලැබිය යුතු ය.

- තෝරා පත් කරගත් නියෝජිතයින් සඳහා ආචාර ධර්ම සංග්‍රහයක් තිබිය යුතු ය. එම සංග්‍රහය උල්ලංඝනය කරන තැනැත්තන් අධිකරණය විසින් චෝදනාවට ලක් කරනු ලැබීමට නැතහොත් නැවත කැඳවීමකට යටත් කරනු ලැබීමට හැක්කේය.

- යම් ඡන්ද දායකයකු සතු යම් අපේක්ෂකයකු වෙත සහ යම් පිළිගත් දේශපාලන පක්ෂයක් වෙත ඡන්දය ප්‍රකාශ කිරීමේ වරප්‍රසාදය පිළිගැනීම තුළින්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින්, දේශපාලන පක්ෂ අතර මාරු වීම් තහනම් කරනු ලැබිය යුතු ය. යම් පාර්ලිමේන්තු මන්ත්‍රීවරයකු ඔහු/ඇය පාර්ලිමේන්තුව වෙත තෝරා පත් කරනු ලැබුවේ කවර දේශපාලන පක්ෂයකින්ද, එම පක්ෂය හැර වෙනත් දේශපාලන පක්ෂයක් නියෝජනය කිරීමට අපේක්ෂා කරන්නේ නම්, ඔහු/ඇය ඡන්ද දායකයාගේ ඡන්දය ප්‍රකාශ කිරීමේ අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇත්තේ යැයි සහ තම පාර්ලිමේන්තු ආසනයෙන් ඉවත් වූයේ යැයි සලකනු ලැබිය යුතු ය.

- ජනතාවගේ වරප්‍රසාදය හෝ ආචාර ධර්ම සංග්‍රහය උල්ලංඝනය කරන්නා වූ, පාලනයේ සියලු මට්ටම්වල තෝරා පත් කරගත් නියෝජිතයින් සඳහා නැවත කැඳවීමේ ක්‍රමවේදයක් පිහිටවනු ලැබිය යුතුය. එංගලන්තයේ සහ වේල්සයේ 2015 පාර්ලිමේන්තු මන්ත්‍රීවරයින් නැවත කැඳවීමේ පනත මේ සම්බන්ධයෙන් මාර්ගෝපදේශයක් ලෙස ගත හැකි ය.

- අපේක්ෂකයන් විසින් සහ වෙනුවෙන් මැතිවරණය ආශ්‍රිත වියදම් සම්බන්ධයෙන් සීමාවක් තිබිය යුතු ය. මූල්‍ය පරිත්‍යාගවල මූලාශ්‍ර සහ ප්‍රමාණ පිළිබඳව ද අනාවරණය කළ යුතු ය. අපේක්ෂකයින් වගකිවයුතු බවට පත් කිරීම සඳහා දැඩි ක්‍රමවේදයක් නීතිය මගින් හඳුන්වා දෙනු ලැබිය යුතු ය.

- බලාපොරොත්තු සහිත අපේක්ෂකයන් විසින් මැතිවරණයකට පෙර සහ තේරී පත් වූයේ නම් එතැන් සිට ඔවුන්ගේ ධුරය අවසන් වන තෙක් සෑම වර්ෂයකම වත්කම් හා වගකීම් පිළිබඳ ප්‍රකාශයක් සිදු කරනු ලැබිය යුතු ය. මෙය ප්‍රසිද්ධ කරනු ලැබිය යුතු අතර එවිට ඉදිරිපත් කර ඇති දේ නිවැරදි නොවන්නේ නම් මහජනතාව අතරින් යම් අයෙකුට ඒ පිළිබඳ ප්‍රශ්න කළ හැකි වේ.

- රජයේ ලියාපදිංචි වී ඇති සංක්‍රමණික ශ්‍රමිකයන්ට ඡන්දය ප්‍රකාශ කිරීමට අවසර ලබා දිය යුතු අතර සුදුසු යාන්ත්‍රණයක් හඳුන්වා දෙනු ලැබිය යුතු ය.

- මැතිවරණ අතරතුර දී ප්‍රචාරණය සම්බන්ධයෙන් වන නියාමනය කිරීම් දැඩිව බලාත්මක විය යුතුය. රජය විසින් විශේෂයෙන්ම සීමිත සම්පත් සහිත අපේක්ෂකයින් සඳහා මාධ්‍යය තුළ සමාන කාලයක් ලබා දිය යුතු ය. පරිසර හිතකාමී මැතිවරණ ප්‍රචාරණ කටයුතු සහ සාමාන්‍ය ජනතාවගේ එදිනෙදා ජීවිතයට අනිසි ලෙස බාධාවක් නොවන ප්‍රචාරණ කටයුතු සඳහා උනන්දු කරවනු ලැබිය යුතු ය.

### උ෧) විමධ්‍යගත කිරීම/ බලය පැවරීම/ බලය බෙදාහදා ගැනීම

- නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින්, දැනට පවරා ඇති බලතල අඩු කිරීමකින් තොරව විෂය නිශ්‍රිත විශ්ලේෂණයක් හරහා දහතුන්වන සංශෝධනයේ දෝෂ සඳහා ප්‍රතිකර්ම කළ යුතු ය.
- තීරණ ගැනීමේ බලතල පළාත් වලට පැවරීම මගින්, සමාජයීය බහුත්වවාදය සම්බන්ධයෙන් වඩා හොඳ නියෝජනයක් සහ ප්‍රධාන සහ පළාත්බද ආයතන අතර වඩා හොඳ බලතල සමබරතාවක් සහතික කර ගනිමින් ප්‍රජාතන්ත්‍රවාදී රාජ්‍යයක් ශක්තිමත් වනු ඇත.
- පළාත් පාලන සහ වෙනත් මට්ටම් වල පාලන සහ පරිපාලන ව්‍යුහයන් අතර කිසිදු කර්තව්‍යයන් පුනරාවර්ත වීමක් නොතිබිය යුතු ය.
- පළාත් පාලනයේ බලතල ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ දැක්වනු ලැබිය යුතු ය. තෝරා පත් කරගනු ලැබූ පළාත් නියෝජිතයින්ට ඔවුන්ට හිමි පිළිගැනීම ලබා දිය යුතු අතර ආණ්ඩුකාරවරයාගේ ධුරය සීමාසහිත විය යුතු ය.
- විමධ්‍යගත කරන ලද බලය සම්බන්ධයෙන් වන හවුල් වගකීමේ සහ වගවීමේ අගය තෝරා පත් කරගනු ලැබූ පළාත් නියෝජිතයින් විසින් නිරූපණය කරනු ඇත.

## එ) අධිකරණය

මූලික අයිතිවාසිකම් පිළිබඳ අධිකරණ බලය විමධ්‍යගත කිරීම

- මූලික අයිතිවාසිකම් පිළිබඳ අධිකරණ බලය විමධ්‍යගත කරනු ලැබිය යුතුය. මෙය පළාත්වලදී යුක්තිය වෙත ප්‍රවේශ වීම තහවුරු කිරීම සම්බන්ධයෙන් අර්ථාන්විත පියවරක් වනු ඇත. මෙම නිර්දේශය දකුණු අප්‍රිකානු ආකෘතිය මත පදනම්ව ඇත.
- මූලික අයිතිවාසිකම් පිළිබඳ අධිකරණ බලය වෙත පළාත්බද ප්‍රවේශ වීම පළාත්බද මහාධිකරණය හෝ ශ්‍රේෂ්ඨාධිකරණය වෙත පවරනු ලබන මූලික අයිතිවාසිකම් පිළිබඳ අධිකරණ බලය මගින් සහතික කෙරෙනු ඇත.

ශ්‍රේෂ්ඨාධිකරණය තුළ කාන්තාවන්ගේ නියෝජනය

- කාන්තාවන් ශ්‍රේෂ්ඨාධිකරණය තුළ නියෝජනය විය යුතු ය. ශ්‍රේෂ්ඨාධිකරණය, දැඩි ලෙස සුපරීක්ෂාකාරී බව අතීත අත්දැකීම් වලින්, උදාහරණයක් ලෙස, පළාත් පාලනය තුළ කාන්තා දේශපාලන නියෝජනය වැඩිවීමට පක්ෂව වෙනස්කම්වලට ලක් වූවන් කෙරෙහි හිතකරව ගන්නා ක්‍රියාමාර්ග සම්බන්ධ මූලික අයිතිවාසිකම් නඩුවේ දී සහ වෙනත් බොහෝ නඩු වලදී, පැහැදිලි වේ. එම නිසා විශ්වාසය සහතික කළ හැකි එකම නියෝජනය එය වේ.

සම්මත වූ නීති පිළිබඳ අධිකරණ සමාලෝචනය

- අධිකරණ සමාලෝචනයේ පුළුල් සහ විස්තෘත බලතල වලට අමතරව, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින්, නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ විධිවිධාන සැලකිල්ලට ගනිමින් පවත්නා සියලු ව්‍යවස්ථාවන් පිළිබඳ සමාලෝචනය සහතික කිරීම සඳහා ශ්‍රේෂ්ඨාධිකරණය හරහා රජය මත බැඳීමක් ඇති කළ යුතු ය.

- ව්‍යවස්ථාවන් සමාලෝචනය කිරීමේදී හෝ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අර්ථ නිරූපණය කිරීමේදී, යම් අධිකරණයක් විසින්:

    a. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ හරය, අපේක්ෂිත අර්ථය සහ අරමුණු ප්‍රවර්ධනය කළ යුතු බව;

    b. විවෘත, සාධාරණ, ප්‍රජාතන්ත්‍රවාදී සහ බහුත්ව සමාජයකට පාදක වන අගයයන් ප්‍රවර්ධනය කළ යුතු බව;

    c. අන්තර්ජාතික නීතිය පිළිබඳ සලකා බැලිය හැකි බව; සහ

    d. විදේශීය නීතිය (වෙනත් අධිකරණ බලයන් හි අභ්‍යන්තර නීතිය) පිළිබඳ සලකා බැලිය හැකි බව;

  නිර්දේශ කෙරේ.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත කිරීමෙන් අවුරුදු දෙකක් ඇතුළත, අධිකරණයේ සමාලෝචනයට ලක් කරන ලද ලිඛිත හෝ ලිඛිත නොවූ සියලු නීති,

ශ්‍රේෂ්ඨාධිකරණය විසින් සමාලෝචනය කරනු ලැබිය යුතු ය. මූලික අයිතිවාසිකම් පිළිබඳ පරිච්ඡේදයේ විධිවිධාන සමග අනුකූල නොවන එවැනි යම් නීතියක් වේ නම් ඒ පිළිබඳව ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ප්‍රකාශ කළ යුතු අතර ඊට අමතරව, එවැනි නීතියක් අනුකූල කිරීම සඳහා යෝජනා කරන ලද සංශෝධන පිළිබඳ නිර්දේශයක් සිදු කළ යුතු ය.

- සම්මත කරන ලද නීතිවල ව්‍යවස්ථානුකූලභාවය පිළිබඳ අධිකරණයේ තීරණය, ගන්නා ලද ක්‍රියාමාර්ග සම්බන්ධයෙන් අතීතයට බල නොපෑ යුතු ය.

## ඒ) රාජ්‍ය මූල්‍ය

- කාන්තා අයිතිවාසිකම් ඉහල නැංවීම සම්බන්ධයෙන් මූල්‍ය ව්‍යාප්තියේ වැදගත්කම සැලකිල්ලට ගෙන, වාර්ෂික අයවැය සකස් කිරීමේ ක්‍රියාවලියේදී වැඩි විනිවිදභාවයක් සහ විධානාත්මක උපදේශනයක් පවත්වා ගැනීම අත්‍යවශ්‍ය වේ. විශේෂයෙන්ම, සම්පත් ව්‍යාප්තියේ දී සහ වෙන් කිරීමේ දී කාන්තාවන්ගේ අවශ්‍යතා පිළිබිඹු වන බව සහ සැලකිල්ලට ගෙන ඇති බව සහතික කිරීම සඳහා, රාජ්‍ය මූල්‍ය පිළිබඳ ව්‍යවස්ථාදායක විධිවිධානවලට ස්ත්‍රී පුරුෂ සමජභාවී අයවැයකරණය පිළිබඳ මූලධර්ම අන්තර්ගත විය යුතු ය.

- මූල්‍ය කළමනාකරණයේදී ස්ත්‍රී පුරුෂ සමජභාවී සමානාත්මතාව සහතික කිරීම සඳහා, ජාතික, පළාත්බද සහ ප්‍රාදේශීය පාලන පිළිබඳ සියලු නීති සහ ප්‍රතිපත්ති, ස්ත්‍රී පුරුෂ සමජභාවී සමානාත්මතා බලපෑම පිළිබඳ සම්මත ඇගයීමකට ලක් විය යුතු ය.

- තවද, වියදම සහ රාජ්‍ය සේවා සැපයීම ස්ත්‍රී පුරුෂ සමජභාවී දෘෂ්ටිකෝණයකින් අධීක්ෂණය කිරීම සඳහා ස්ත්‍රී පුරුෂ සමජභාවී බලපෑම පිළිබඳ ප්‍රකාශයක් සමග, ජාතික සහ පළාත්බද වාර්ෂික අයවැය ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර එයින් රජයේ සම්පත්වලට කාන්තාවන්ගේ ප්‍රවේශය වැඩි කළ යුතු ය.

## ඔ) මහජන ආරක්ෂාව

- නිත්‍ය අයිතිවාසිකම්, හදිසි අවස්ථාවන් වලදී ආරක්ෂා කරගත යුතු හීන නොවන අයිතිවාසිකම් ලෙස පිළිගත යුතු බව අන්තර්ජාතික නීතිය විසින් විධානය කරයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින්, පැරිස් මූලධර්මවල සහ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ සිවිල් සහ දේශපාලනික අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය යටතේ හීන විය නොහැකි ලෙස පිළිගෙන ඇති අයිතිවාසිකම් පිළිගත යුතු ය.

- වෙනත් මූලික අයිතිවාසිකම් වලින් ඇති වන හීන කිරීම් ද පහත දැක්වෙන දැඩි කොන්දේසිවලට යටත් විය යුතු ය

    a) හීන විය නොහැකි අයිතිවාසිකම් සීමාංකනය කිරීම (හීන විය නොහැකි අයිතිවාසිකම්මොනවාද යන්න නම් කිරීම)

b) නිවේදනය කිරීමේ මූලධර්මය (හදිසි අවස්ථාවන්හි දී යම් නිශ්චිත අයිතිවාසිකම් හීන විය හැකි බවට නිල නිවේදනයක් ලබා ගැනීමට යම් තැනැත්තකුට ඇති අයිතිවාසිකම)

c) සමානුපාතිකතා රීතිය, (සීමා කරනු ලැබිය යුතු අයිතිවාසිකම් හදිසි අවස්ථා ප්‍රකාශනය මගින් අවධානයට ලක් විය යුතු යැයි අපේක්ෂිත ආරක්ෂක අවශ්‍යතා වලට සමානුපාතික විය යුතු ය) සහ අවශ්‍යතා තත්ත්වය අදාළ විය යුතු ය.

d) හදිසි අවස්ථා ප්‍රකාශන එම හදිසි අවස්ථාවට අනුව කාල නිශ්චිත විය යුතු බව.

e) වෙනත් අන්තර්ජාතික බැඳීම් සමග අනුකූලතාව.

f) හීන කිරීමේ පියවර වෙනස්කම් කිරීමෙන් තොර විය යුතුය.

- කිසිදු හදිසි අවස්ථා පියවරකට කාන්තාවන්ට එරෙහිව වෙනස්කම් සිදු කළ නොහැකි වේ.

### ඕ) ඉහත සඳහන් නොකළ වෙනත් වැදගත් අංශ

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ භාෂාව

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සියලු භාෂා වලින්, ස්ත්‍රී පුරුෂ විභේදනයකින් තොර සහ ස්ත්‍රී පුරුෂ සමජභාවයට සංවේදී ආකාරයකින් ලියනු ලැබිය යුතු ය.

නීතිපතිවරයාගේ ධූරය

- මෙම ධූරයේ ප්‍රධාන කාර්යභාරය සහ වගකීම සලකා බලන විට, නීතිපතිවරයාගේ ධූරය පාදක කොටගත් ප්‍රතිපත්ති පිළිබඳ විශේෂිත පැහැදිලි කිරීමක් පවතින හෙයින් එය උත්තරීතර වැදගත්කමකින් යුක්ත වේ.
- කාන්තාවන්ට යුක්තිය සඳහා ඉඩප්‍රස්ථාව ලබා ගැනීම සඳහා, නිල නීතිඥ මණ්ඩලයේ ප්‍රධාන නීති නිලධරයා වෙමින් යුක්තිය පසිඳලීමේදී මෙම ධූරයේ කාර්යභාරය ඉටු කරන ස්වාධීන නීතිපතිවරයකු අවශ්‍ය වේ.
- නීතිපතිවරයාගේ ධූරය හා සම්බන්ධ වගන්තියට;
  a) නීතියේ ආධිපත්‍ය ප්‍රවර්ධනය කිරීම, ආරක්ෂා කිරීම සහ දිගටම පවත්වාගෙන යාම සඳහා සහ මහජන සුභසිද්ධිය ආරක්ෂා කිරීම සඳහා,
  b) අධිකරණයන් හරහා යුක්තිය පසිඳලීම සඳහා සහාය දැක්වීමට සහ එය ආරක්ෂා කිරීම සඳහා,
  c) අධිකරණයන් විසින් ඒවායෙහි කර්තව්‍ය ඉටු කිරීමේදී සහ ඒවායෙහි අධිකරණ විධානයන් ක්‍රියාත්මක කිරීමේදී ස්වාධීනත්වය, අපක්ෂපාතිත්වය, අභිමානය, ප්‍රවේශ්‍යතාවය සහ කාර්යක්ෂමතාව සහතික කිරීම සඳහා;

  වන බැඳීම් ඇතුලත් විය යුතු බව නිර්දේශ කෙරේ.

රජයේ අපරාධ නඩු සම්බන්ධ ස්වාධීන අධ්‍යක්ෂ මණ්ඩලය

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින් රජයේ අපරාධ නඩු සම්බන්ධ ස්වාධීන අධ්‍යක්ෂ මණ්ඩලයක් හඳුන්වා දෙන ලෙසට යෝජනා කෙරේ. රජයේ අපරාධ නඩු මෙහෙයවන විශේෂිත ශක්‍යතාවන් සහිත නිශ්චිත සහ ස්වාධීන ධූරයක අවශ්‍යතාව ඇතැම් අධිකරණ බල විසින් හඳුනාගෙන ඇත. මෙය, විශේෂයෙන්ම සාපරාධී වැරදි සහ පොදු නීතිය සම්බන්ධ වන නඩු වලදී, මහජන සහ ව්‍යවස්ථාදායක සුබසිද්ධිය සාධනීය ලෙස ස්ථිරවම පවත්වාගෙන යන බව සහතික කර ගැනීම සඳහා වේ.

- රජයේ අපරාධ නඩු සම්බන්ධ ස්වාධීන අධ්‍යක්ෂ මණ්ඩලයක් විසින් නෛසර්ගික සම්බන්ධතා ගැටුම්වලට ප්‍රතිචාර දක්වනු ඇත: ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පවත්වාගෙන යාමට සහ රාජ්‍යයේ යහපත පිණිස කටයුතු කිරීමේ යුතුකම ද සහිතව, මූලික අයිතිවාසිකම් උල්ලංඝනය කර ඇත්තේ යැයි චෝදනා ලද රජයේ නිලධාරීන් නියෝජනය කරමින් හෝ අධිකරණ සමාලෝචනයකට යටත් ව, නීතිපතිවරයාගේ ධූරයේ විධානයන් අතිච්ඡාදනය කරමින් නෛසර්ගික වූ සම්බන්ධතා ගැටුමක් දැනට පවතී. පුද්ගලයින්ගේ ආරක්ෂකයා වීමේ සහ යුක්තිය ඉටු නොවීම වැළක්වීමේ යුතුකම ස්ථිරව ඉටු කරගෙන යාමේ සම්ප්‍රදායික කාර්යභාරය සම්බන්ධයෙන් කලින් කළට එකඟතාවට එළඹ ඇත. මේ අනුව, මෙම ධූරය පාලනය කරන ප්‍රතිපත්ති සම්බන්ධයෙන් ශක්තිමත් ව්‍යවස්ථානුකූල තත්ත්වයක් අත්‍යවශ්‍ය වේ.

- ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව විසින්, රජයේ ප්‍රධාන නීති නිලධරයා විය හැකි නීතිපතිවරයාගේ ධූරය අර්ථ දක්වන බව සහ එම ධූරය, රාජ්‍යය වෙනුවෙන් කටයුතු කරන එහෙත් ආණ්ඩුව වෙනුවෙන් නොවන, රජයේ අපරාධ නඩු සම්බන්ධ අධ්‍යක්ෂවරයාගෙන් වෙන්කොට හඳුන්වන බව තහවුරු කර ගැනීම අත්‍යවශ්‍ය වේ.

- මේ අනුව, පාර්ලිමේන්තුව විසින්, රජයේ අපරාධ නඩු සම්බන්ධ අධ්‍යක්ෂ යන ස්වාධීන ධූරය ඇති කිරීම සඳහා විධිවිධාන සලසමින් නීති පැනවිය හැකිය. එහි පත් කිරීමේ බලධරයා අධිකරණ සේවා කොමිෂන් සභාව විය යුතු අතර එමගින් එම ධූරය එවකට පවතින විධායකයෙන් සහ ව්‍යවස්ථාදායකයෙන් ස්වාධීන ධූරයක් බවට පත් කෙරේ.

කුමුදිනි සැමුවෙල්
වැඩසටහන් අධ්‍යක්ෂ

නිලිණි ද අල්විස්
වැඩසටහන් නිලධාරී

විසින් කාන්තාව සහ මාධ්‍යය සාමූහිකය වෙනුවෙන් ඉදිරිපත් කරන ලදී.

2020 දෙසැම්බර් 31